ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,163 - 2020 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා - 2020.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | 738 |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 739 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2020 පෙබරවාරි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 පෙබරවාරි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 මාර්තු මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**වයඹ පළාත් සභාව**

මහා නගර සභා නියෝග

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 289 වන වගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ ආණ්ඩුකාරවර සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ බලතල ක්‍රියාත්මක කරන අහමඩ් ජමාල්දීන් මොහොමඩ් මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහා නගර සභාවල සභිකයින් සඳහා සන්නිවේදන හා ප්‍රවාහන දීමනා ගෙවීමට අදාළ නියෝග සංශෝධනය කර මෙයින් පනවනු ලැබේ.

අහමඩ් ජමාල්දීන් මොහොමඩ් මුසම්මිල්,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2019 දෙසැම්බර් මස 24 වැනි දින,
කුරුණෑගල දී ය.

**නියෝග**

1. මෙම නියෝග මහා නගර සභාවල සභිකයින් සඳහා සන්නිවේදන හා ප්‍රවාහන දීමනා ගෙවීමට අදාළ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. මහා නගර සභාවල සභිකයින් සඳහා සභාවේ විධිමත් යෝජනා සම්මතයකින් නගරාධිපතිවරයා සඳහා රු. 10,500.00 ක් ද, නියෝජ්‍ය නගරාධිපතිවරයා සඳහා රු. 8,500.00 ක් ද සහ අනෙකුත් සභිකයින් සඳහා රු. 7,000.00 ක් ද ලෙස උපරිමයකට යටත්ව සන්නිවේදන දීමනාවක් ගෙවීමට හෝ එම උපරිමයට යටත්ව මාසික දුරකතන බිල්පත් පියවීම යන දෙකෙන් එක් කාරණයක් සඳහා පමණක් මාසිකව ගෙවිය හැක.

3. මහා නගර සභාවල සභිකයින් සඳහා සභාවේ විධිමත් යෝජනා සම්මතයකින් රු. 7,000.00 ක උපරිමයකට යටත්ව ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකිය.

4. මෙම දීමනා සභා අරමුදලෙන් ගෙවිය යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ආදායම් පවතින බවට සභාව සහතික වන්නේ නම් ඊට වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබිය යුතුය.

5. පහත සඳහන් අවස්ථාවන් හි දී මහා නගර සභා සභිකයින් සන්නිවේදන හා ප්‍රවාහන දීමනා සඳහා හිමිකම් නොලබයි.

*(අ)* (i) දීමනා ගෙවීමට අදාළ මාසයෙහි පවත්වන ලද මහා සභා රැස්වීමට සහ කාරක සභා රැස්වීම්වලට මහා සභාවේ අනුමැතියකින් තොරව සහභාගී නොවීම.

(ii) කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටීම.

(iii) වයඹ පළාත් සභාවේ 1991 අංක 01 දරන වයඹ පළාතේ පළාත් පාලන ආයතන (පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල) ප්‍රඥප්තියට අනුව හෝ මහා නගර සභා ආඥාපනතේ 277 වගන්තිය යටතේ යම් මහා නගර සභාවක සභිකයන්ගේ කටයුතු හා කාර්යයන් අත්හිටුවා තිබීම.

එසේ වුවද, රැඳවුම් භාරයේ සිටි හෝ සිරගතව සිටි හෝ නිවාඩු ලබා සිටි හෝ සේවය අත්හිටුවා සිටි කාලය කිසියම් මාසයකින් කොටසක් වන අවස්ථාවකදී එම මාසයේ ඉතිරි කාලය සඳහා අනුපාතිකව ගණන් බලා මෙම දීමනා ගෙවනු ලැබිය හැකිය.

6. මෙම නියෝගයේ (අ) ඡේදයේ (1) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද සභිකයින් රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමකට සහභාගි නොවීම මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතුය.

මහා නගර සභාවල සභිකයින් සඳහා සන්නිවේදන දීමනා ගෙවීමට පෙර විෂයභාර අමාත්‍යවරයා විසින් පනවා 2014.11.28 දිනැති අංක 1891 දරන *ගැසට්* පත්‍රයේ පලකර තිබූ මහා නගර සභා නියෝග මෙයින් අවලංගු කර මෙම නියෝගය මෙතැන් සිට බලාත්මක වේ.

මෙම නියෝගයේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

02-214

# පළාත් සභා නිවේදන

## ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු පළාත

1983 අංක 32 සහ 1992 අංක 11 දරන සංශෝධිත පනත් සමග කියැවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(2) වගන්තිය ප්‍රකාරව ඈවර කර වසා දැමීමේ නිවේදනය

1983 අංක 32 සහ 1992 අංක 11 දරන සංශෝධිත පනත් සමග කියැවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(2) වගන්තිය ප්‍රකාරව පහත දැකවෙන උපලේඛනයෙහි දක්වෙන එක් එක් සමිතිය ඉදිරියෙන් දක්වා ඇති දිනයේ සිට ඈවර කර වසා දැමීමට නිවේදනය මෙයින් නිකුත් කරනු ලැබේ.

පොන්නම්බලම් වාගිසන්,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්,
උතුරු පළාත.

| අනු. අංකය | කලින් ලියාපදිංචි කළ අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 01 | JE/65 | සීමාරහිත කෝයිලාක්කන්ඩි සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිතිය | 20.08.1999 | යාපනය |
| 02 | J/72 | සීමාරහිත ආදී මයිලිඩ්ඩි එක්සත් ණය ගණුදෙනු සමිතිය | 25.08.1999 | යාපනය |
| 03 | J/320 | සීමාරහිත පුලියන්කුඩල් සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිතිය | 28.02.1998 | යාපනය |
| 04 | J/1194 | සීමාරහිත කච්චායි සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිතිය | 20.08.1999 | යාපනය |
| 05 | J/598 | සීමාසහිත කරුකම්බානෙයි ගබඩා සමුපකාර සමිතිය | 20.08.1999 | යාපනය |
| 06 | JE/55 | සීමාසහිත කයිතඩි නැගෙනහිර එක්සත් ණය ගණුදෙනු සමිතිය | 31.10.2001 | යාපනය |
| 07 | JE/207 | සීමාසහිත පේදුරුතුඩුව කම්කරු සමුපකාර සමිතිය | 15.09.1998 | යාපනය |
| 08 | J/1358 | සීමාරහිත පන්නාලෙයි බටහිර සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිති | 15.08.2001 | යාපනය |
| 09 | JE/100 | සීමාරහිත චාවකච්චේරි කාන්තා එක්සත් ණය ගණුදෙනු සමිතිය | 18.09.2001 | යාපනය |
| 10 | J/1288 | සීමාරහිත තෝප්පුක්කාඩු විනායගර් එක්සත් ණය ගණුදෙනු සමිතිය | 16.12.2002 | යාපනය |
| 11 | J/1037 | සීමාරහිත වඩමරාච්චි කෘෂි නිෂ්පාදන හා අළෙවි සමුපකාර සමිතිය | 30.08.1999 | යාපනය |
| 12 | J/962 | සීමාරහිත කෝයිට්කඩවෙයි එක්සත් ණය ගණුදෙනු සමිතිය | 03.08.1999 | යාපනය |
| 13 | JE/1200 | සීමාසහිත වඩමරාච්චි වාහන සේවා සමුපකාර සමිතිය | 28.10.1999 | යාපනය |
| 14 | J/1200 | සීමාරහිත උතුරු වරණිඑක්සත් ණය ගණුදෙනු සමිතිය | 15.08.1999 | යාපනය |
| 15 | JE/20 | සීමාරහිත පුවරලෙයි එක්සත් ණය ගණුදෙනු සමිතිය | 15.09.1989 | යාපනය |
| 16 | J/16 | සීමාරහිත ඊලගාමම්ණය ගණුදෙනු සමිතිය | 30.11.1998 | යාපනය |
| 17 | J/1276 | සීමාරහිත කොඩිගාමම් එක්සත් ණය ගණුදෙනු සමිතිය | 30.07.2000 | යාපනය |
| 18 | J/1036 | සීමාරහිත වදිරි මහත්මාජී එක්සත් ණය ගණුදෙනු සමිතිය | 01.12.1998 | යාපනය |
| 19 | J/908 | සීමාසහිත යාල් සංගීත කළාසකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිතිය | 01.12.1998 | යාපනය |
| 20 | JE/66 | සීමාරහිත කුමාරත්තුප්පිට්ඩි කාන්තා එක්සත් ණය ගණුදෙනු සමිතිය | 31.08.1998 | යාපනය |

| අනු. අංකය | කලින් ලියාපදිංචි කළ අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 21 | J/332 | සීමාරහිත වදිරි මධ්‍යම එක්සත් ණය ගණුදෙනු සමිතිය | 01.12.1998 | යාපනය |
| 22 | J/187 | සීමාරහිත පුත්තූර් එක්සත් ණය ගණුදෙනු සමිතිය | 01.12.1998 | යාපනය |
| 23 | J/936 | සීමාරහිත යාපනය මලයාලම් දුම්කොල නිෂ්පාදන හා අලෙවි සමුපකාර සමිතිය | 31.07.2000 | යාපනය |
| 24 | JE/52 | සීමාරහිත ඉමෙයානන් විශ්වඑකුල්සත් ණය ගණුදෙනු සමිතිය | 18.03.2004 | යාපනය |
| 25 | J/219 | සීමාරහිත තාවඩි උතුර එක්සත් ණය ගණුදෙනු සමිතිය | 04.03.2005 | යාපනය |
| 26 | J/317 | සීමාරහිත තිරුනෙල්වේලි උතුර එක්සත් ණය ගණුදෙනු සමිතිය | 18.03.2004 | යාපනය |

02-220

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.